බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ අවසාන ඇගයීම - 2000

ගණිතය

7 ශ්‍රේණිය | I හා II | කාලය පැය 2 යි

නම : ..............................................................................................

## I කොටස

◆ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. 38+21+9+105 සංඛ්‍යාවල එකතුව සෙවීමේදී අග ඉලක්කම් පමණක් පරීක්ෂා කර පිළිතුර ඔත්තේ සංඛ්‍යාවක්ද, ඉරට්ටේ සංඛ්‍යාවක්දැයි ලියන්න.

02. සම්මත ආකාරයට ලියන්න. 1002002002

03. අවට පරිසරයේ සෘජුකෝණ දකින්නට ලැබෙන අවස්ථා 2 ක් ලියන්න.

04. එකතු කරන්න.

| m | cm |
|---|---|
| 3 | 40 |
| 5 | 85 |
| | |

05. සුළු කරන්න $4x+2x-x$

06.




රූපයේ දැක්වෙන තුලාවෙහි සමතුලිතතාවය සලකා $x$ හි අගය සොයන්න.

07.




ඉහත අංක 1,2,3,4, ත්‍රිකෝණ අතරින් සමපාද ත්‍රිකෝණ යුගලයක් තෝරා ඒවායේ අංක ලියන්න.

08. හිස්තැනට යෙදිය යුතු නිවැරදි පිළිතුර ඔබේ පිළිතුරු පතෙහි ලියන්න.
යම් සංඛ්‍යාවක අග ඉලක්කම් දෙකෙන් දැක්වෙන සංඛ්‍යාව ........................ නම් එම සංඛ්‍යාව 4 න් බෙදේ.

09. රූපයේ පාද සියල්ල එකිනෙකට සමාන වේ.
කෝණ සියල්ල එකිනෙකට සමාන වේ.
මේ රූපයට යොදන නම නිවැරදිව ලියන්න.




10. රූපයේ වර්ණ කර ඇති මිශ්‍රභාගය $2\frac{1}{2}$ ය.
එහි පරස්පරය ලියන්න.




11.

| යන්ත්‍රයේ තද කරන යතුර | දිස්වන සංඛ්‍යාව (ප්‍රතිඵලය) |
|---|---|
| 5 | 15 |
| 7 | 21 |
| 8 | 24 |

එක් විශේෂ යන්ත්‍රයක එක් එක් යතුර තද කල විට දක්නට ලැබෙන ප්‍රතිඵල මේ වගුවේ දැක්වේ. ඒ යන්ත්‍රයේ 10 යතුර තදකල විට ලැබෙන ප්‍රතිඵලය ලියන්න.

12. සංඛ්‍යා රේඛාවේ නිරූපනය කර ඇති සදිශ සංඛ්‍යාවලින් කුඩාම සංඛ්‍යාව ලියන්න.




13. හිස්කොටුවලට ගැලපෙන ඉලක්කම් යොදා නැවත ලියන්න.

```
  3 . □ 3
  0 . 7 □ +
  4 . 6 0
```

14. චතුස් තලයක මුහුණත් ගණන 4කි. ශීර්ෂගණන 4 කි. එහි දාර ගණන ලියන්න.

15. පැය. 24 ඔර්ලෝසුවක දැක්වෙන මෙම වේලාව අන්තර ජාතික සම්මත ක්‍රමයට ලියන්න




16. විස්කෝතු පැකැට්ටුවක බර 1Kg 500g වේ. එවැනි පැකට් 5 ක බර සොයන්න.

17. එක් වාහනයක් පෙට්රල් ලීටර් 5 කින් 50km ක දුර ගමන් කරයි. පෙට්රල් ලීටරයක් යෙදූ විට ගමන් කල හැකි දුර සොයන්න.

18. එක් වෙළඳ සැලක එක් සතියකදී දින 5 කදී විකුණන ලද සහල් ප්‍රමාණ පිළිබඳ තොරතුරු තීර ප්‍රස්තාරයේ නිරූපනය වේ.




To download past papers visit

අඟහරුවාදා, විකුණූ සහල් ප්‍රමාණයට වඩා සිකුරාදා විකුණූ සහල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම්කීයකින් වැඩිද?

19. 1 ත් 10 ත් අතර ප්‍රථමක සංඛ්‍යා ලියන්න.

20. සිසුන් 10 දෙනෙකු ලබාගත් ලකුණු ප්‍රමාණ වෘන්ත පත්‍ර සටහනේ දැක්වේ.

| වෘන්ත | පත්‍ර |
|---|---|
| 0 | 6 8 9 |
| 2 | 0 2 3 |
| 4 | 5 7 |
| 5 | 2 8 |

සිසුන් 10 දෙනාගෙන් ලබාගත් ලකුණු වලින් වැඩිම ලකුණු ප්‍රමාණය ලියන්න.

## II කොටස

- **ප්‍රශ්න <u>හයකට</u> පමණක් පිළිතුරු ලියන්න.**

01. (අ) 18,12,30 හි මහා පොදු සාධකය සොයන්න.

(ආ) i. 

මෙම සටහනේ දැක්වෙන ගුණිත බන්ධන සියල්ල ලියන්න.

ii. ඉහත සාධක දී ඇත්තේ කවර සංඛ්‍යාවෙහිද?

02. (අ) රූපය වෙනත් යහළුවෙකු ලබා ඇන්දවීමට ඔබ දෙන උපදෙස් මාලාව ඔබේ වචනයෙන් ලියන්න.




(ආ) මෙම කෝණවල දළ රූප සටහන් ඇඳ නම් කරන්න.

i. සුළු කෝණය
ii. සෘජු කෝණය
iii. මහා කෝණය
iv. පරාවර්ත කෝණය
v. සරල කෝණය

03. (අ) සුළු කරන්න (i). 3.65 x 100 (ii) 40.75÷25

(ආ) පාර්සල් දෙකක බර ප්‍රමාණ 3kg 65g 5mg සහ 1kg 900g 2mg වේ. බරින් වැඩි පාර්සලය, කුඩා පාර්සලයට වඩා කවර බර ප්‍රමාණයකින් වැඩි වේද?

04. (අ) i. 4,0, (-1), 2, -4, සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.

ii. (-2), 6, 5, (-1) සදිශ සංඛ්‍යා එකම සංඛ්‍යා රේඛාවක නිරූපනය කරන්න.

(ආ) i. "<" හෝ ">" ලකුණ යොදා පහත සඳහන් භාග සම්බන්ධ කරන්න $\frac{2}{3}......\frac{2}{5}$

ii. රුපියල් 450 ක් අමර හා අනුර අතර 5:4 අනුපාතයට බෙදූ විට අනුරට ලැබෙන මුදල සොයන්න.

05. (අ)




A රූපය




B රූපය

i. A රූපයේ වර්ගඵලය සොයන්න

ii. B රූපයේ වර්ගඵලය සොයන්න


To download past papers visit
www.vajirapani.blogspot.com


iii. B සෘජුකෝණාස්‍රයකි A හි නම ලියන්න

iv. Aරූපයේ වර්ගඵලය හා B රූපයේ වර්ගඵලය පිළිබඳ ගත හැකි නිගමනය ලියන්න.

(අ) පැත්තක දිග 22.5 cm වන රාමුවක පරිමිතිය සොයන්න.

06. (අ) i. a = 2 සහ b = 3 වන විට 4ab වල අගය සොයන්න.

(ආ) i. සිරත් පැයට කිලෝමීටර x වේගයෙන් පැය 4 ක පා පැදියෙන් ගමන් කරයි. ඉන්පසු වේගය දෙගුණ කර, තව පැය 4 ක මෝටර් සයිකලයෙන් ගමන් කරයි. ඔහු ගමන් කල මුළු දුර 48 km කි.

a. පා පැදියෙන් ගිය මුළු දුර කිලෝ මීටර කීයද?

b. මෝටර් සයිකලයෙන් ගිය මුළු දුර කිලෝ මීටර කීයද?

c. ගමන් කළ මුළු දුර x ඇසුරින් සමීකරණයකින් පෙන්වන්න.

d. සමීකරණය විසඳා x හි අගය සොයන්න.

07. (අ) පුළුකර දර්ශක ආකාරයෙන් දක්වන්න $5 \times 5 \times 5 \times X \times X$

(ආ) 1994 සිට 1998 දක්වා වර්ෂවල වී මිලයට ගත් වෙළෙන්දෙකු ලබාගත් වී අස්වනු ප්‍රමාණ මෙම වගුවෙහි දැක්වේ.

| වර්ෂය | වී ප්‍රමාණය කිලෝ ග්‍රෑම් |
|---|---|
| 1994 | 4000 |
| 1995 | 6000 |
| 1996 | 6500 |
| 1997 | 5000 |
| 1998 | 7000 |

ඒකකයකින් වී කිලෝ ග්‍රෑම් 1000 ක් ලෙස සලකා මෙම තොරතුරු තීර ප්‍රස්තාරයකින් දක්වන්න.

08. (අ) පියෙකු, දුවක සහ පුතෙකුගේ බර පිළිවෙලින් 100 kg ,50kg, 50kg වේ. ගඟක් හරහා මේ තිදෙනාට එතෙර විය යුතුය. යා යුතු බෝට්ටුවේ ගෙන යා හැකි උපරිම බර 100 kg කි. මේ තිදෙනා ගඟෙන් එගොඩ වියයුතු ආකාරය පැහැදිලි කරන්න.තිදෙනාටම බෝට්ටුව පැදවිය හැක.

(ආ) i. රූපයේ කේන්ද්‍රය නම් කරන්න.

ii. රූපයේ ඇති සමචතුරස්‍ර 2ක් නම් කරන්න.

iii. PQRS සමචතුරස්‍රයේ පරිමිතිය 56cm කි. පැත්තක දිග සොයන්න.

iv. YO දිග සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

v. වෘත්තයේ විෂ්කම්භය ලියන්න.

